


# සහ චාරු

**චාරු....**
**බිත්ති හතරක් අතර හිරවුණු**
**ලස්සන ජීවිතයක්**
**පාලු කාමර වය්වාරණ**
**කැටයම් කරපු කලුවර බඩුමුට්ටු**
**හතරවටන්ම ....**
**ඇහිපිල්ලන් නොගහ බලාඉන්න**
**මළගිය ඇත්තන්ගෙ පින්තූර**
**මේ මළගිය ලෝකයේ**
**පණඇති දේකට ඇත්තේ**
**චාරු විතරයි....**
**ලස්සන දේකට ඇත්තෙ**
**චාරු විතරයි....**

සත්‍යජිත් රායිගෙ දෘෂ්‍ය කාව්‍යයක අපට හමුවන " චාරුලතා" වෙනුවෙන් තිස්ස අබේසේකරයන් රචනා කළ උක්ත දැක්වූ නිදහස් කවිපෙළ මට හමුවන්නේ පසුගිය අගෝස්තු හය වනදා දිවයින පුවත්පතට අජිත් ගලප්පත්ති විසින් ලියන ලද එක්තරා සංවේදී සටහනක් කියවාගෙන යන අතරතුරදීය. මගේ මතකයේ හැටියට චාරුගේ නම තිස්ස අබේසේකරගේ සටහන් වල මට හමුවන්නේ මීට දශකයකට හමාරකට පමණ පෙරය.

තිස්ස අබේසේකරගේ "අයාලේ ගිය සිතක සටහන් " ලිපිපෙළ ලක්බිම පුවත්පතේ පළවන අවධියේ මම හදූ යෞවනියක්මි. පසු කලෙක එය පොතක් ලෙස මුද්‍රණය වූ පසු අම්මා ගමන් ගාස්තු ලෙස දෙන මුදලින් කොටසක් ඉතිරි කරගෙන ඒ පොත මිලදී ගත්තේ පොත කෙරෙහි තිබූ බලවත් ආශාව නිසාමය. තිස්ස අබේසේකර ඒ පොත පිළිගන්වා තිබුණේ තම දරුවන් පස්දෙනාටය. එහි තුන්-වැන්නට දක්වා තිබුණේ **චාරුලතා ශ්වේතාම්බරී** ගේ නමයි. ප්‍රථම වතාවට මට ඇගේ නම ඇස ගැහුණේ එදාය. "චාරු" තිස්ස අබේසේකරගේ මද්දුම දෝණිය. චාරුගේ මව ප්‍රවීණ ලේඛිකාවක වන **පුෂ්පා මීවැල්ලයි.**

මීට විසි වසරකට පෙර තිස්ස ඉංගිරිසියෙන් ලියූ " බ්‍රිගින් ටෝනි හෝම්" කෘතියට ඔහුට ග්‍රේෂන් සම්මානය හිමිවන්නේය. අද ඔහුගේ මද්දුම දෝණී ග්‍රේෂන් සම්මානය දිනා ඇත. ඇගේ Autumn Leaves අත්පිටපත 2011 වසරේදී ග්‍රේෂන් සම්මානය සඳහා නිර්දේශ වූ අතර ඇගේ Stories අත්පිටපත 2016 වසරේ ග්‍රේෂන් සම්මානය දිනා ගත්තේය. Stories සහ චාරු පිළිබඳව පුවත්පත් ගණනාවක පළවූ ලිපි කියවාවත් මට චාරුගෙන් අසා දැනගත යුතු වූ කිසිදු කරුණකට පිළිතුරු සොයා ගත නොහැකි වූයෙන් අවසානයේ මම ඇයට විද්‍යුත් ලිපියක් ලීවෙමි.

චාරුලතා ශ්වේතාම්බරී අබේසේකර තෙවරාතන්ත්‍රී සහ මා අතර විද්‍යුත් ලිපි හරහා හුවමාරු වූ කරුණු අතරින් කිහිපයක් උපුටා මෙම ලිපිය සකස් කරන්නේ සන්නස පාඨකයන් වන ඔබ වෙනුවෙනි.

**ඔබ කිසියම් ලේඛන හැකියාවක් ඇති දැරියක බව ප්‍රකට කළ , ඔබට සිහිපත් වන පළමු සිදුවීම කුමක්ද ?**

**චාරු:**
මට වයස අවුරුදු පහක් පමණ තරම් කාලයේ දී , අපේ ශ්‍රාතී ගෙදරක පිටුපස තිබූ හොඳින් වැඩුණු පලින් බර වුණු ලොවි ගහක් දිහා බලාගෙන මා කවියක් පබැඳුවලු.

ලොවි ගහ පිරිලා
ලොවි ගෙඩි හැදිලා
ගහ රතු පාටයි
හරිම ලස්සනයි
උදේ බලනකොට
ලොවි බිම වැටිලා
බිම රතුපාටයි
හරිම ලස්සනයි

එය තමයි, මා තුල කිසියම් නිර්මාණ ශක්තියක් තිබෙන බවට මා නොවන මා වටා සිටි මගේ සමීපතමයින් විසින් හඳුනාගත් අවස්ථාව හැටියට මගේ මතකයට නැගෙන පැරණිම සිදුවීම. නිර්මාණ ශක්තිය පුබුදුවන බොහොම සුන්දර පරිසරයක් වුණු රුවැන්වැල්ල අම්තිරිගල ගමේ මගේ ළමා කාලය ගෙවුණා. බොහොම නිදැල්ලේ ගෙවුණා ඒ අතීතය පසුකලෙක මගේ ලේඛන දිවියට විශාල බලපෑමක් කළා.

**ඔබ කුඩා කළ මහත් අභිරුචියකින් කියවූයේ කුමන ආකාරයේ පොත පතද?**
**ළමාවියේ සිට ප්‍රගුණ කළ කියවීම ඔබේ වර්ථමාන සාහිත්‍යකරණයට බලපෑවේ කෙසේද?**

**චාරු:**
අපේ පරම්පරාව පොතපත කියවීමට විශාල කාලයක් වැය කළ පරම්පරාවක්. සීනී ඔතපු කොළේ පටන් ශේක්ෂ්පියර් කෘති දක්වා කියවපු පුළුල් රසයක් තිබුණු සහ කියවීමේ මහත් පිපාසාවකින් පෙළුණු පරම්පරාවක පුරුකක් මම.

මා කුඩා කාලයේ මාර්ටින් වික්‍රමසිංහ ශූරීන්ගේ පොත් සියල්ලම පාහේ කියෙව්වා. " මඩොල්දූව" පටන් "බවතරණය" දක්වාම කුඩා වියේදීම කියවා අවසන් කළේ බලවත් ආසාවෙන්.

"කුමාර පද්‍ය මාලා" නම් වූ කොළඹ යුගයේ කවීන්ගේ නිර්මාණ ඇතුළත් පැරණි පොතක් පිටු දියවෙන තුරු දිනපතා නැවත නැවත කියෙව්වා මට හොඳින් මතකයි. ඩබ්ලියු ඒ සිල්වාගේ අවිචාර සමය, විජයබා කොල්ලය, ජයතිස්ස සහ රොසලින් ඇතුළු නවකතා මෙන්ම ටී බී ඉලංගරත්නගේ බොහෝ නවකතා වයස අවුරුදු දහය පමණ වන විට කිහිප වතාවක් කියවා මට කටපාඩම් වී තිබූ පොත්පත් යැයි කීවොත් වඩාත් හරි.



මව - පුෂ්පා මීවැල්ල මහත්මියට පොත පිළිගන්වමින්

**කියවීම සහ ලේඛනය අතර පවතින අනවරත සම්බන්ධයට ඔබ ලබාදෙන අර්ථකථනය කවරක්ද?**

**චාරු:**
පොත් කියවීමෙන් ලේඛකයකුට ලැබෙන එක් පුහුණුවක් වන්නේ , යමක් පාඨකයකුට දැනෙන ලෙසට ඉදිරිපත් කිරීම සඳහා උදාහරණ රාශියක් සපයා ගත හැකිවීමයි. එයින් නිතැතින්ම තම ලේඛන ශෛලිය පෝෂණය වෙනවා. මෙය මගේ පෞද්ගලික අත්දැකීමයි. භාෂාව හෝ සාහිත්‍ය කලාව හෝ ලේඛන කලාව කිසිදාක හදාරා නැති මට ග්‍රේෂන් සම්මානය දිනාගන්න බලපෑ එක් ප්‍රබල හේතුවක් වුණේ අසීමාන්තිකව පොතපත කියවීමයි.

කියවීම යනු හුදු අධ්‍යයනයක් මෙන්ම දැනුම හා ආකල්ප එක්රැස් කිරීමක්. මා දකිනා ලෙස ලේඛණය යනු එකතු කරගත් දැනුම හා ආකල්ප තමන්ගේම හැඟුම් වලින් තවත් ඔප දමා නැවත සමස්ත සමාජයට මුදාහැරීමක්. (Like input and output)



කියවීම ඔබට පොදුවේ සාර්ථක සහ අසාර්ථක රචනයන් පිළිබඳව නොමඳව උදාහරණ සපයනවා. එකම අදහසක් ප්‍රකාශ කළ හැකි නොයෙක් විධි සම්බන්ධව මෙන්ම එකම සිදුවීම දෙස බැලිය හැකි නොයෙක් කෝණ සම්බන්ධව පුළුල් වැටහීමක් ස්වයං අවබෝධයක් ඔබ වෙත .ලබාදෙනවා. සිත් ඇදගන්නා සුළු ලෙස වදන් හැසිරවීම පිළිබඳව ඔබව දැනුවත් කරනවා. අවසානයේ සාර්ථක රචනයක් කිරීමට අවශ්‍ය පෝ ෂණය නිතැතින්ම ඔබ වෙත ලබාදෙනවා. එය ඉතාම ප්‍රායෝගික පුහුණුවක් බව අවශ්‍යයෙන්ම සඳහන් කළ යුතුයි.

**චාරුලතා අබේසේකර යන නම සමාජගත වන විට ඔබට දැනෙන අභිමානය විස්තර කළ හැකිද?**

**චාරු:**
අවංකවම ලොකු අභිමානයක් නම් දැනෙන්නේ නැහැ. අම්මා, නෑදෑයෝ සහ දූ දරුවෝ සතුටු වෙන විට මට සතුටක් දැනෙනවා.එපමණයි.

**ඔබේ පියාගෙන් පසුව සිනමාලෝකයේ හිස් වූ විශිෂ්ඨ තිර රචකයන්ගේ අඩුව පුරවන්නට ඔබ ප්‍රවිශ්ඨ වේවිද?**

**චාරු:**
ඔබ කියන අඩුව පුරවන්නට නම් අත්දැකීම් රාශියක් අවශ්‍ය වෙනවා. පියාගේ අඩුව පුරවන්න ආත්ම ගණනක් ගියත් මට බැරිවේවි. තිර රචනයට, ඒ කියන්නේ වචන තුලින් රූප මැවීමට, නිසඟ හැකියා-වක් තාත්තිගේ දරුවන් සියල්ලන්ටම පාහේ තියෙනවා. ලේඛනයට යම් හෝ දක්ෂතාවක් නො දක්වන දරුවෙකු මගේ පියාට නැහැ. ලොකු අක්කා, අපර්ණාට ලස්සනට සිංහල කවි, නිසඳැස් ලියන්න පුළුවනි.චූටි අක්කා, නොරිකෝ ,පොතක් ලියා පල කර තිබෙනවා. නමුත් මේ දෙන්නම දූ දරුවන්ට කැප වීම නිසා, තම හැකියාවන් අතරමග නතර කරගත්තා.නංගී, ස්වෙත්ලානාට ඉතාමත් හොඳින් ඉංගිරිසියෙන් ලිවීමේ හැකියාවක් තිබෙනවා.මල්ලී, දිමිත්‍රි,වැඩිය ලියන්නේ නැති වුණාත්,තාත්තා ගැන පුවත්පතකට ලියා තිබූ ලිපිය ඉතා අනර්ඝයි. තිර රචනය කිරීමට සමහරවිට අපි එක්කෙනෙකුට අවස්ථාවක් ලැබේවි.



**සිනමාව ඔබට කෙතරම් සමීපද? පියාගේ සිනමා කෘතීන් තුල ඔබ දකින විශිෂ්ඨ ලක්ෂණ මොනවාද?**

**චාරු:**
මම සිනමා පිස්සෙක්. හැබැයි ටිකක් තෝරා බේරාගෙන නරඹන්නෙක්.
තාත්තිගෙ සිනමා කෘති වල තිබෙන විශේෂිත ගුණයක් තමයි, පෙනෙන රූප රාමුවට වඩා, ඇසෙන දෙබසට වඩා ගැඹුරින් විහිදෙන යම් සංකල්පයක් හෝ හැඟුමක් ප්‍රේක්ෂකයා තුලින් අවදි කරවීමට ඇති හැකියාව. හැම විටම යටි පෙළ අරුත, එළි පිට පේන්නට තිබෙන දෙයට වඩා අධ්‍යාත්මිකයි, සුන්දරයි,මානුෂිකයි. තව මම ආස ගුණයක් තමයි මතභේදාත්මක ආන්දෝලනාත්මක සිදුවීම් ඉතා සූක්ෂම ලෙස, සමහරවිට සංකේතාත්මකව,ඉදිරිපත් කිරීම.

**ඔබේ නිර්මාණ තුලින් වඩාත් ඉස්මතු වන්නේ ඔබද? නැතහොත් පොදු සමාජ යාන්ත්‍රණය තුල ඔබට පැවරී තිබෙන වගකීමද?**

**චාරු:**
මට හිතෙන්නේ මම කියලයි. නමුත් මට කියන්න දෙයක් තියෙනවනේ. ඒක තමයි මා සතු සමාජ මෙහෙවර.සමාජයට ඉටු විය යුතු යුතුකම හැටියට මම දකින්නේ මේ භෞතික ලෝකයෙන් එහා ගිය විශ්ව සත්‍යයක්, සමාජ ආකල්ප තුලින් තෙම්පරාදු නොවුණු අමු අරුතක් ජීවිතයකට තියෙනවා කියන ශ්‍රද්ධානය යළි මතකයට නැගීමයි. එය බොහෝ දෙනෙකුට අමතකව ගිය ඇත්තක්. මේ තරඟය ඇතුලේ පැත්තකට තල්ලු වුණු ඇත්තක්. එය දැකපු දවසට ඔබට හිතේවි මේ ලෝකය කොයි තරම් සුන්දරද කියලා. අයිති කරගන්න,එපා වෙන්න,වෛර කරන්න,තරඟ කරන්න දෙයක් එතකොට ඉතුරු වෙන්නේ නැහැ.

**නිර්මාණය සහ ඔබ එකිනෙකින් වියුක්ත වන්නේ කවර අවස්ථාවේද?**

**චාරු:**
කොයිම වෙලාවකවත් නැහැ.

**ග්‍රේෂන් සම්මානය හිමිවීම තුල ඔබේ ලේඛන දිවිය තුල ඇතිවූ සාධනීය හා ආකර්ෂණීය විචලතා මොනවාද?**

**චාරු:**
ලොකුම දේ තමයි ලේඛිකාවක් හැටියට මගේ ආත්ම ශක්තිය වර්ධනය වීම.

**දේශීය හෝ විදේශීය වශයෙන් ඔබ වඩාත් පරිශීලනය කරන පොත පත මොනවාද?**

**චාරු:**
මේ ළඟදී නම් ආසාවෙන් කියෙව්වා බටුවන්ගල රාහුල හිමියන්ගේ "රන් කරඬුව".ශ්‍රී ලාංකික ලේඛකයන්ගේ පොත් නම් බේදයක් නැතුව අතට අහුවෙන එක කියවනවා. විදේශීය කතුවරයන්ගෙන් නම් වැඩිපුරම ආසා සල්මන් රුෂ්ඩිගේ පොත් වලට.

**සන්නස වෙනුවෙන්**
**සාකච්ඡා කර සම්පාදනය කළේ**
**උපේක්ෂා සේනානායක**



**Autumn Leaves හා Stories ඔබේ ජීවිතය සමඟින් පවතින සම්බන්ධය ඔබට දැනෙන්නේ කෙසේද?**

**චාරු:**
ඒක එතරම් සංකීර්ණ නැහැ. සරල සුන්දර බැඳීමක්. මවක හා දරුවකු අතර ඇති සබඳතාවය වගේ . නමුත් දෘඪ බැඳීමක්. Autumn Leaves ලියවුණේ , තාත්තා නැති වුණාට පස්සේ හිතේ තෙරපෙමින් තිබුණ සිතුවිලි ලියන්නට පටන් ගත් නිසයි. ඉබේටම එය ප්‍රබන්ධයක් බවට පෙරළුණා. Stories ලියවුණේ මුරුසියේ ජීවත් වෙද්දි ලංකාව ගැන මතකයන් අවදි වෙන්න පටන් ගත් නිසයි. මේ කතන්දර දෙක විතරක් නෙවෙයි මම ලියන බොහෝ දේ මගේ හිතේ ගැඹුරට දැනුණු අවස්ථා වල මතුවුණු සිතුවිලි තමයි.හැම නිර්මාණකරුවෙකුම තම නිර්මාණයට වෙන් නොකළ හැකි ලෙස බැඳී ඇත කියලයි මට හිතෙන්නේ.

28 වන පිටට